## <u>අරමුණ</u>

මෙම පොත් පිංච සකස්කිරීමේ අරමුණ වන්නේ ගුවන් හමුදාවෙන් නීත්‍යානුකූලව ඉවත්ව යන/ විශ්‍රාම ලබා ගන්නා සේවා පුද්ගලයින් හට ගුවන් හමුදාවෙන් ඉවත්ව යන මොහොතේ සහ ඉවත්ව ගිය පසු අනුගමනය කලයුතු ක්‍රියාපිළිවෙත් සිහිගැන්වීම සහ එම ක්‍රියපිළිවෙත් අනුගමනය නොකිරීම හේතුවෙන් සේවා පුද්ගලයින් හට හිමිවිය යුතු ප්‍රතිලාභ අහිමිවීම වලක්වාලීමයි. තවද මෙම පොත ඔබගේ අනාගත පරිශීලනය සඳහා නිවසේ සුරක්ෂිතව තබා ගන්න.

<u>ස්තූතිය</u>

ගුවන් හමුදාවෙන් නීත්‍යානුකූලව ඉවත්ව යන/ විශ්‍රාම ලබා ගන්නා සේවා පුද්ගලයින් හට හිමිවිය යුතු ප්‍රතිලාභ සහ එම ප්‍රතිලාභ අහිමිවීම වලක්වාලීම සඳහා අනුගමනය කලයුතු ක්‍රියාපිළිවෙත් සම්බන්ධව පැහැදිලි කරදෙමින් මෙම පොත්පිංච නිවැරදිව සකස්කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම සහ මඟපෙන්වීම් සිදුකල, අධ්‍යක්ෂ පිරිස් පරිපාලන එයාර් කොමඩෝර් සුහාෂ් ජයතිලක, අධ්‍යක්ෂ ගිණුම් පරිපාලන එයාර් කොමඩෝර් නාලක සපුගස්තැන්න, මාණ්ඩලික නිලධාරි රජයේ ගිණුම් විංග් කමාන්ඩර් ජිනේන්ද්‍ර රණසිංහ, මාණ්ඩලික නිලධාරි පී3 ස්කොඩ්රන් ලීඩර් ප්‍රදීප් වන්නිනායක යන නිලධාරීවරුන්ටත් සහකාර මාණ්ඩලික නිලධාරි විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ස්කොඩ්රන් ලීඩර් ලක්ෂිකා ගුණරත්න නිලධාරීතුමියටත්, අඩුපාඩු පෙන්වා දෙමින් නිරතුරුවම අධීක්ෂණ කටයුතු සිදුකල වැටුප් හා ලේඛන අංශභාර බලලත් නිලධාරී 28189 ප්‍රධාන බලලත් නිලධාරී එච්.ඩබ්.ඒ.එස් වල්ගම, විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික අංශභාර බලලත් නිලධාරී 28491 ප්‍රධාන බලලත් නිලධාරී එස්.ආර්.එම්.එස් රාජපක්ෂ, පී3 අංශභාර බලලත් නිලධාරී 28270 බලලත් නිලධාරී එම්.ඩී.එල්.සී චන්ද්‍රකුමාර, විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික අංශයේ 32506 බලපංති සැරයන් පුෂ්පකුමාර ඊ.ජී.එස් සහ පිලියෙල කිරිම සඳහා කටයුතු සිදුකල 37964 සැරයන් ගුණරත්න බී.පී.ඒ යන අයට මාගේ විශේෂ ස්තූතිය පුදකර සිටිමි.

**(වීටීඑස් සිරිමාන්න)**
එයාර් වයිස් මාර්ෂල්
**අධ්‍යක්ෂ ජෙනරාල් පරිපාලන**

**<u>ඔබගේ සහය සඳහා පහත සඳහන් නිලධාරීන් සමග සම්බන්ධ විය හැකිය</u>**

අධ්‍යක්ෂ ජෙනරාල් පරිපාලන (DGA) : 077-2229007

අධ්‍යක්ෂ ජෙනරාල් සුභසාධක (DGW) : 077-2229011

අධ්‍යක්ෂ පිරිස් පරිපාලන (DPA) : 077-2229033

අධ්‍යක්ෂ ගිණුම් පරිපාලන (DAA) : 077-2229032

මාණ්ඩලික නිලධාරි රජයේ ගිණුම් (SO Pub Accts) : 077-2275846
වැටුප් සම්බන්ධ ගැටලු

මාණ්ඩලික නිලධාරි පී2 (SO P2) : 077-2275073
නිලධාරීන්ගේ පරිපාලන ගැටලු

මාණ්ඩලික නිලධාරි පී3 (SO P3) : 077-2275279
නිත්‍ය ගුවන් භට ගුවන් කාන්තාවන්ගේ පරිපාලන ගැටලු

අණදෙන නිලධාරි ස්වේච්ඡා ගුවන් හමුදාව (CO VAF) : 077-2229083
ස්වේච්ඡා ගුවන් භට ගුවන් කාන්තාවන්ගේ පරිපාලන ගැටලු

භාණ්ඩාගාරික විධායක යහසාධක අරමුදල : 077-2229462
(Treasurer CBF)

අරමුදල් කළමනාකරු ගගන විරු සවිය : 077-2275652
(Fund Manager GVS)

ගුවන් හමුදා විශ්‍රාම වැටුප් අංශය : 011-2434879
(P&R Pension Branch)

ශ්‍රී ලංකා ගුවන් හමුදාව : 011-2441044

<u>පටුන</u>


1. විශ්‍රාම තොරතුරු පරික්ෂා කිරීම 4
2. විශ්‍රාම වැටුප අඛණ්ඩව ලබා ගැනීම 4
3. විශ්‍රාමික සේවා පුද්ගලයා මියගිය අවස්ථාවකදී ක්‍රියාකල යුතු ආකාරය 5
4. රණවිරු මාපිය රු 750/= දීමනාව ගෙවීම 8
5. ගගන විරු සවිය (GVS) සහ ගගන සුව සවිය (GSS) අරමුදල් වල සාමාජිකත්වය ලබා ගැනීම 9
6. ගගන සුව සවිය අරමුදලේ ප්‍රතිලාභ 13
7. විශ්‍රාමික සේවා පුද්ගලයන් වෙනුවෙන් සපයා ඇති සුභසාධන සේවාවන් 15
8. මියගිය විශ්‍රාමික සේවා පුද්ගලයන් වෙනුවෙන් සිදුකරනු ලබන සුභසාධන සේවාවන් 16
9. විශ්‍රාමික සේවා හැඳුනුම්පත - මුලික නිකුත් කිරීම 18
10. කල් ඉකුත්වී ඇති විශ්‍රාමික සේවා හැඳුනුම්පතක් නැවත සකස් කරගැනීම 20
11. විශ්‍රාමික සේවා හැඳුනුම්පත අස්ථානගතවූ විට නැවත සකස් කරගැනීම 21
12. ගුවන් හමුදා සේවා වාර්තාව (නිලධාරීන්) Record of Service (Officers) 22
13. ගුවන් හමුදා සේවා සහතිකය (F.1394) සෙසු නිලයන් සඳහා 24
14. ගුවන් හමුදා වෘත්තීය සහතිකය - Trade Certificate 25
15. රණවිරු පවුල්වල දරුවන් සඳහා ලබාදෙන ශිෂ්‍යත්ව වැඩසටහන (ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය) 26
16. රණවිරු පවුල්වල දරුවන් සඳහා රජයේ විශ්ව විද්‍යාල වල ඇතුලත්වීම් ලබාදීම 27
17. විශ්‍රාමික ගුවන් හමුදා නිලධාරීන්ගේ සංගමය 28
18. ශ්‍රී ලංකා ගුවන් හමුදා සේවා මුක්ත සංගමය 28
19. ශ්‍රී ලංකා ගුවන් හමුදා සේවා මුක්ත සංගමයේ සුව සුරැකුම් සුභ සාධක අරමුදල 29
20. ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමය 30

## 1. <u>විශ්‍රාම තොරතුරු පරික්ෂා කිරීම</u>

අ. විශ්‍රාම තොරතුරු පරික්ෂා කිරීම සඳහා sathkara.pensions.gov.lk/ public services වෙත පිවිසෙන්න.

ආ. ඉහත වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් අනතුරුව ඔබගේ ජා.හැ අංකය ඇතුලත් කිරීමෙන් පසු පහත තොරතුරු ලබාගත හැක.

(1) විශ්‍රාම වැටුප් අංකය.
(2) සම්මුඛ පරික්ෂණය පැවැත්වෙන දිනය.
(3) විශ්‍රාම වැටුප සහ පාරිතෝෂික මුදල පිළිබඳ තොරතුරු.

ඇ. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පහත දුරකථන අංක හා සම්බන්ධ වීමෙන් වැඩිදුර තොරතුරු ලබා ගත හැක.

**1970 ක්ෂණික ඇමතුම්**
**0112209870**
**0112524649**
**0115920118**
**0112381664**

## 2. <u>විශ්‍රාම වැටුප අඛණ්ඩව ලබා ගැනීම</u>

අ. ඔබගේ 'ජීවත්වීම තහවුරු කිරිමේ සහතිකය'(Life Certificate) ග්‍රාම නිලධාරීගෙන් ලබාගෙන සෑම වසරකම මාර්තු මස 31 දිනට පෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාදිය යුතුය.

ආ. ඔබ විදේශගත වන්නේ නම් ඒ පිළිබඳව ඔබගේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කල යුතුය.

## 3. විශ්‍රාමික සේවා පුද්ගලයා මියගිය අවස්ථාවකදී ක්‍රියාකල යුතු ආකාරය

අ. මියගිය විශ්‍රාමික සේවා පුද්ගලයා හට සේවා අවමංගල්‍ය කටයුත්තක් අවශ්‍යනම් 0112441044 දිගුව 12041 වෙත දැනුවත් කළ යුතුය.

අ. විශ්‍රාමිකයා මියගිය පසු ඔහු/ඇය ලැබූ විශ්‍රාම වැටුප ඔහුගේ/ඇයගේ කලත්‍රයාට හෝ අර්ථලාභීන්ට (Spouse/ Beneficiary) ලබා ගත හැක.

ඇ. විශ්‍රාමිකයා මියගිය බව තම ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කිරීමෙන් අනතුරුව ගුවන් හමුදා විශ්‍රාම වැටුප් අංශයේ පහත දු.ක අංක වෙත දැනුවත් කළ යුතුය.

0112434879<br>
0112441044 දිගුව 12633/12667

ඈ. කලත්‍රයා ගුවන් හමුදා විශ්‍රාම වැටුප් අංශය වෙත පැමිණීමට පෙර ඉහත සඳහන් කර ඇති දුරකථන අංක ඇමතීම මඟින් පැමිණීමට දිනයක් සහ වේලාවක් වෙන් කරවා ගත යුතුය.

ඉ. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප(W&OP) ලබාගැනීමට ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන පහත දක්වා ඇති අතර මේ පිළිබඳව ගුවන් හමුදා විශ්‍රාම වැටුප් අංශය මඟින් විශ්‍රාමිකයාගේ කලත්‍රයාට/අර්ථලාභියා වෙත ලිපියක් මඟින්ද දැනුවත් කරනු ලබයි.

(1) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් විශ්‍රාමිකයා හට ලබා දෙනු ලබන විශ්‍රාමික හිමිකම් පත්‍රය (කලත්‍රයාගේ ඡායාරූපය සහිත රෝස පැහැති හිමිකම් පත්‍රය).

(2) වැන්දඹුවගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත සහ ඡායා පිටපතක්.

(3) වැන්දඹුවගේ ජාතික හැඳුනුම්පතේ පිටපත් දෙකක් (ග්‍රාම නිලධාරි හා ප්‍රාදේශිය ලේකම් විසින් සහතික කළ යුතුය).

(4) සේවා පුද්ගලයාගේ මරණ සහතිකයේ මුල් පිටපත සහ ඡායා පිටපතක් (ග්‍රාම නිලධාරි විසින් සහතික කළ යුතුය).

(5) විවාහ සහතිකයේ මුල් පිටපත සහ ඡායා පිටපතක් (ග්‍රාම නිලධාරි විසින් සහතික කළ යුතුය).

(6) සේවා පුද්ගලයාගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත සහ ඡායා පිටපතක් (ග්‍රාම නිලධාරි විසින් සහතික කළ යුතුය).

(7) සේවා පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පතේ පිටපත් දෙකක් (ග්‍රාම නිලධාරි හා ප්‍රාදේශිය ලේකම් විසින් සහතික කළ යුතුය).

(8) ඉහතින් සඳහන්කර ඇති ලියකියවිලි වල වෙනසක් තිබේ නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයන් (නීතීඥයෙකු හෝ සාමදාන විනිශ්චයකාර වරයෙකු සහතික කර තිබිය යුතුය).

(9) වැන්දඹුවගේ 3½cm X 4½cm වර්ණ ඡායාරූප හතරක්.

(10) වයස අවුරුදු විසි හයට අඩු දරුවන් සිටීනම් ඔවුන්ගේ උප්පැන්න සහතික වල මුල් පිටපත් සහ ඡායා පිටපත් එක බැගින් (ග්‍රාම නිලධාරි විසින් සහතික කළ යුතුය).

(11) ආබාධිත දරුවන් සිටීනම් (වයස් භේදයකින් තොරව) ඔවුන්ගේ උප්පැන්න සහතික වල මුල් පිටපත් සහ ඡායා පිටපත් එක බැගින් (සෞඛ්‍ය 307 වෛද්‍ය වාර්තාව හා 10cm X 15cm ප්‍රමාණයේ ග්‍රාම නිලධාරි හා ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද වර්ණ ඡායාරූපයක්).

(12) වැන්දඹුවගේ මුදල් තැන්පත් කලයුතු තනි පුද්ගල බැංකු ගිණුම් පොතෙහි ඡායාපිටපත් දෙකක් (ග්‍රාම නිලධාරි විසින් සහතික කළ යුතුය).

(13) වැන්දඹුව නැවත විවාහයක් සිදුකරගෙන නොමැති බවට ග්‍රාම නිලධාරි හා ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කළ ලිපිය.

(14) වැන්දඹුව රජයේ රැකියාවක නිරතවන්නේද යන්න සඳහන් ලිපිය (ග්‍රාම නිලධාරි හා ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කළ යුතුය).

(15) PD 4 අයදුම්පත්‍රය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ලබාගෙන, එහි සඳහන් විස්තර සම්පූර්ණ කර රැගෙන ආ යුතුය (ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර තිබිය යුතුය).

(16) භාවිතයේ පවතින දුරකථන අංකයන් ලබාදෙන්න.

ඊ. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම අංකය (W&OP No) විශ්‍රාමිකයාගේ සේවා අංකයම වේ.

උ. කලත්‍රයා මියගිය පසු වයස අවු.26 ට අඩු රැකියා විරහිත දරුවන් සඳහා විශ්‍රාම වැටුප ලබා ගත හැකි අතර, ආබාධිත දරුවන් සඳහා ඔවුන් මියයන තුරුම විශ්‍රාම වැටුප හිමිවේ (ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම).

ඌ අවිවාහක විශ්‍රාමිකයෙක් විශ්‍රාම දිනයෙන් පසු විවාහ වුවහොත් එම විවාහයට අදාල කලත්‍රයාට හෝ දරුවන්ට ඔහුගේ ඇවෑමෙන් විශ්‍රාම වැටුපකට හිමිකමක් නොමැත.

එ. විවාහක විශ්‍රාමිකයෙක් විශ්‍රාම දිනයෙන් පසු නැවත විවාහ වුවහොත් එම විශ්‍රාමිකයාගේ විශ්‍රාම දිනයට පෙර විවාහ වලට අදාල වයස අවුරුදු විසි හයට අඩු රැකියා විරහිත දරුවන් සඳහා පමණක් ඔහුගේ ඇවෑමෙන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපකට (W&OP) හිමිකමක් ඇත.

## 4. රණවිරු මාපිය රු 750/= දීමනාව ගෙවීම

අ. රණවිරු මාපිය දීමනාව හිමිවන්නේ 2009.05.19 ට පෙර ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත බැඳුනු සේවා පුද්ගලයින්ගේ දෙමාපියන් සඳහා පමණක් වේ.

ආ. රණවිරු මාපිය රු. 750/= දීමනාව ගෙවීම සඳහා ගුවන් හමුදා විශ්‍රාම වැටුප් අංශයෙන් ලබා දුන් අයදුම් පත්‍ර නිසි පරිදි පුරවා ලබා දිය යුතුය.

ඇ. දෙමාපියන්ගේ 'ජීවත්වීම පිළිබඳ සහතිකය' සෑම වසරකම දෙසැම්බර් මස පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

**අංශ භාර නිළධාරි**
**විශ්‍රාම වැටුප් අංශය**
**පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය**
**ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය**
**තැ.පෙ 594**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ 10100**

ඇ. විශ්‍රාමික සේවා පුද්ගලයින්ගේ දෙමාපියන් මියගිය විගස ගුවන් හමුදා විශ්‍රාම වැටුප් අංශය පහත දුරකතන අංක ඇමතීම මඟින් දැනුවත් කළ යුතු වේ.

**0112434879**
**0112441044 දිගුව 12633/12667**

## 5. ගගන විරු සවිය (GVS) සහ ගගන සුව සවිය (GSS) අරමුදල් වල සාමාජිකත්වය ලබා ගැනීම

අ. මෙම අරමුදල් වල සාමාජිකත්වය විශ්‍රාම ගැනීමත් සමඟ අවසන් වන බැවින් සාමාජිකත්වය ඉදිරියට පවත්වා ගැනීමට අවශ්‍ය සේවා පුද්ගලයින් විශ්‍රාම පූර්ව නිවාඩුව අවසන් වීමට පෙර මුදල් ගෙවා මෙම අරමුදලේ සාමාජිකත්වය යාවත්කාලීන කර ගත යුතුය.

ආ. මාසික සාමාජික ගාස්තුව

(1) ගගන විරු සවිය – රු. 600/=
(2) ගගන සුව සවිය – රු. 500/=

ඇ. සාමාජිකත්වය ඉදිරි වර්ෂය සඳහා යාවත්කාලීන කිරීමේදී පවතින වර්ශයේ දෙසැම්බර් මස තිස්එක් වන දිනට පෙර මුදල් ගෙවා අවසන් කල යුතුය. තවද මේ සඳහා සාමාජික මුදල් ගෙවීම තම අභිමතය පරිදි පහත සඳහන් ආකාරයට මාස 06 සිට අවුරුදු 05 දක්වා එකවර ගෙවීමේ හැකියාව ඇත.

| කාල සීමාව | ගගන විරු සවිය සඳහා ගෙවිය යුතු මුදල (රු.) | ගගන සුව සවිය සඳහා ගෙවිය යුතු මුදල (රු.) | ගෙවිය යුතු මුළු මුදල (රු.) |
|---|---|---|---|
| මාස 06 | 3,600.00 | 3,000.00 | 6,600.00 |
| අවුරුදු 01 | 7,200.00 | 6,000.00 | 13,200.00 |
| අවුරුදු 02 | 14,400.00 | 12,000.00 | 26,400.00 |
| අවුරුදු 03 | 21,600.00 | 18,000.00 | 39,600.00 |
| අවුරුදු 04 | 28,800.00 | 24,000.00 | 52,800.00 |
| අවුරුදු 05 | 36,000.00 | 30,000.00 | 66,000.00 |

ඈ. විධායක සුභසාධක අරමුදල (CWF) වෙත සාමාජික මුදල් ගෙවීම තමා වෙත බැංකුව විසින් ලබා දුන් කේත අංකය (Shift Code) යොදා බැංකුව වෙත තැන්පත් කිරීම් මඟින් හෝ www.airforce.lk/gvs/ වෙත පිවිසීම තුලින් සිදු කළ හැකිය.

ඉ. රක්ෂණාවරණය හිමිවන්නේ සේවා පුද්ගලයා සඳහා වයස අවුරුදු 70 දක්වාත්, කලත්‍රයා සඳහා වයස අවුරුදු 65 දක්වාත් සහ මාස 6ට වැඩි අවුරුදු 21ට අඩු දරුවන් දෙදෙනෙකු සඳහාත් පමණි.

ඊ. නියමිත කාලපරිච්ඡේදයන් තුලදී සාමාජික මුදල් ගෙවීම් කිරීමට නොහැකි වූ අවස්ථාවන් වලදී දඩ මුදලකට යටත්ව දින 365ක් ඇතුලත පහත සඳහන් ආකාරයට ක්‍රියාකිරීමෙන් සාමාජිකත්වය නැවත ලබාගත හැකිය.

(1) විශ්‍රාමික සාමාජිකයා සහ කලත්‍රයා තම නිවසට ආසන්නතම ගුවන් හමුදා රෝහලක් වෙත ගොස් වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් විය යුතුය.

(2) වෛද්‍ය පරීක්ෂණ වාර්තා සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව පහත සඳහන් දඩ මුදල් සමඟ තම අභිමතය පරිදි වාරික මුදල් ගෙවීම් සිදු කල යුතුය.

| **ප්‍රමාද කාලය** | **දඩ මුදල (රු.)** | **වසරක වාරික මුදල (රු.)** | **ගෙවිය යුතු මුලු මුදල (රු.)** |
|---|---|---|---|
| මාස 03 කට අඩු | 3,300.00 | 13,200.00 | 16,500.00 |
| මාස 03 සිට මාස 06 දක්වා | 6,600.00 | 13,200.00 | 19,800.00 |
| මාස 06 සිට මාස 09 දක්වා | 9,900.00 | 13,200.00 | 23,100.00 |
| මාස 09 සිට මාස 12 දක්වා | 13,200.00 | 13,200.00 | 26,400.00 |

උ. සාමාජිකත්වය යාවත්කාලීන කරගැනීමෙන් පසු රක්ෂණාවරණය සහ ගගන සුව සවිය අරමුදලේ ප්‍රතිලාභ සඳහා ගුවන් හමුදා නියෝග 856 සහ 859 ට අනුව හිමිකම් ඇත.

**ඌ. සාමාජික මුදල් නොගෙවා දින 365ක කාලසීමාව ඉක්මවා ගිය පසු සාමාජිකත්වය පෙර දැනුම්දීමකින් තොරව අවසන් වන අතර, නැවත සාමාජිකත්වය ලබාගත නොහැක.**

එ. රක්ෂණාවරණයෙන් ලැබෙන ප්‍රතිලාභ

| | **විශ්‍රාමික සේවා පුද්ගලයා සඳහා (රු.)** | **විශ්‍රාමික සේවා පුද්ගලයාගේ කලත්‍රයා සඳහා (රු.)** | **විශ්‍රාමික සේවා පුද්ගලයාගේ මාස 6ට වැඩි අවුරුදු 21ට අඩු දරුවන් සඳහා (රු.)** |
|---|---|---|---|
| ස්වාභාවික මරණයක් සඳහා | 900¸000.00 | 900¸000.00 | නැත |
| හදිසි මරණයක් සඳහා | 1,800¸000.00 | 900¸000.00 | නැත |
| පූර්ණ දුබලතාවයන් සඳහා | 1,000¸000.00 | 500¸000.00 | 300¸000.00 |
| අර්ධ දුබලතාවයන් සඳහා ( ප්‍රතිශතය මත උපරිම) | 1,000¸000.00 | 500¸000.00 | 300¸000.00 |
| බරපතල රෝගාබාධ 24 ක් සඳහා | 900¸000.00 | 900¸000.00 | 900¸000.00 |

ඒ. ගගන විරු සවිය රක්ෂණාවරණය මඟින් ආවරණය වන බරපතල රෝගාබාධ 24 පහත දක්වා ඇත.

(1) හෘදයාබාධ (Heart Attack)
(2) කිරීටක ධමනි අතුරුමන් බද්ධ ශල්‍යකර්මය (Coronary Artery bypass Surgery)
(3) මහාධමනියේ ශල්‍යකර්ම (Aorta Surgery)
(4) හෘදය කපාට ප්‍රතිස්ථාපනය හෝ ප්‍රතිසම්පාධනය (Heart Valve Replacement or Repair)
(5) පිළිකාව (Cancer)
(6) වකුගඩු අක්‍රියවීම (Kidney Failure)
(7) පුප්පුශිය අධ්‍යාතතිය (Pulmonary Hypertension)
(8) යාකූන් ප්‍රධාහය (Fulminant Hepatitis)
(9) ප්‍රධාන ඉන්ද්‍රිය බද්ධය (Major Organ Transplant)
(10) බහුවිධ ඝාරධ්‍යය (Multiple Sclerosis)
(11) අන්ධභාවය (Blindness)
(12) බිහිරිභාවය (Deafness)
(13) ගොළුභාවය (Loss of Speech)
(14) තදබල පිළිස්සුම් (Major Burns)
(15) සන්‍යාසය (Coma)
(16) මොළයේ සිදුකරන ශල්‍යකර්ම (Brain Surgery)
(17) චාලක නියුරෝන රෝගය (Motor Neuron Disease)
(18) නිදන්ගත පෙනහළු රෝග (Chronic Lung Disease)
(19) නිදන්ගත අක්මා රෝග (Chronic Liver Disease)
(20) කිරීටක ධමනි ශල්‍යකර්මය (Balloon Angioplasty)
(21) කාඩියෝ මයෝපති (Cardiomyopathy)
(22) ආඝාතය (Stroke)
(23) ඇප්ලාස්ටික් රක්තහීනතාවය (Aplastic Anemia)
(24) මොළයේ බැක්ටීරියා ආසාදනය (Bacterial Meningitis)

## 6. ගගන සුව සවිය අරමුදලේ (Gagana Suwa Saviya) ප්‍රතිලාභ

| Claim Category | Annual Limit |
|---|---|
| Drugs-Dressing Consultation | 3500/=/Event<br>35000/= per annum |
| Investigation | 25000/= |
| <u>In-ward –medical</u><br>Room charges<br>Other expenses | Overall upper limit<br>200,000/= per annum<br>7000/= per day Max 14 days |
| <u>In-ward –Surgical</u><br>Room Charges<br>Other expenses | 500,000/= per annum<br>7000/= per day Max 14 days |
| Aurvedic Treatment<br>Out patient | 5000/= |
| In-ward | 20000/= |
| Special Payment for Hospitalization at Government Hospitals | 500/= per day maximum 30 days |

අ. ගගන සුව සවිය අරමුදල මගින් විශ්‍රාමික සාමාජිකයා සහ කලත්‍රයා පමණක් ආවරණය වේ.

ආ. ගගන සුව සවිය අරමුදලේ හිමිකම් අයදුම් පත්‍රය අයදුම්පත් ලඟම පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා රෝහලක් වෙත යොමු කලයුතු වේ.

ඇ. විශ්‍රාමික සාමාජිකයා නැවත විවාහ වුවහොත් එම නව කලත්‍රයා මෙම ගගන සුව සවිය අරමුදලේ ප්‍රතිලාභ සඳහා සම්බන්ධ කිරීමට ලිඛිත ඉල්ලීමක් පහත සඳහන් ලියකියවිලි සමඟ ලඟම පිහිටි ගුවන් හමුදා රෝහලක් වෙත ඉදිරිපත් කල යුතුය

| **අවිවාහක පුද්ගලයකු විවාහ වීම** | **පෙර කලත්‍රයා මියගිය පසු නැවත විවාහ වීම** | **පෙර කලත්‍රයා දික්කසාද වීම මත නැවත විවාහ වීම** |
|---|---|---|
| විවාහ සහතිකය | පෙර කලත්‍රයාගේ මරණ සහතිකය | දික්කසාදයේ අවසන් අධිකරණ වාර්තාව (නියත තීන්දුව) |
| කලත්‍රයාගේ උප්පැන්න සහතිකය | නව කලත්‍රයාගේ විවාහ සහතිකය | නව කලත්‍රයාගේ විවාහ සහතිකය |
| කලත්‍රයාගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක් | නව කලත්‍රයාගේ උප්පැන්න සහතිකය | නව කලත්‍රයාගේ උප්පැන්න සහතිකය |
| - | නව කලත්‍රයාගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක් | නව කලත්‍රයාගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක් |

**(ඉහත ලියකියවිලි තුල ඡායා පිටපත් තිබේනම් ඒවා නීතීඥයෙකු හෝ සාමදාන විනිශ්චයකාර වරයෙකු සහතික කර තිබිය යුතුය).**

ඇ. ගගන සුව සවිය අරමුදලේ හිමිකම් අයදුම් පත්‍රය අවසන් පිටුවේ ඇති QR කේතය මඟින් ලබා ගත හැකිය.

7. <u>විශ්‍රාමික සේවා පුද්ගලයන් වෙනුවෙන් සපයා ඇති සුභසාධන සේවාවන්</u>

අ. කටුනායක සහ අත්තිඩිය පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා උත්සව සහ සම්මන්ත්‍රණ ශාලාව සාමාජිකයින්ගේ පුද්ගලික වෙන්කිරීම් සඳහා 15%ක වට්ටමකට යටත්ව වෙන්කරවා ගත හැකිය.

ආ. පවුලේ විශේෂ උත්සව සඳහා ගුවන් හමුදා නර්තන කණ්ඩායම, සංගීත කණ්ඩායම සහ කැමරා ශිල්පීන්ගේ සේවය ගෙවීමේ පදනම මත ලබාගත හැකිය.

ඇ. ශ්‍රී ලංකා ගුවන් හමුදා සුභ සාධක වෙළඳසැල් වලින් භාණ්ඩ මිලදී ගත හැකිය.

ඈ. ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරු වල පිහිනුම් තටාක සහ ක්‍රීඩා පහසුකම් ලබාගත හැකිය.

ඉ. කොළඹ ‘රයිෆල් ග්‍රීන්’ සහ ‘ඊගල්ස් ස්කයි වීව්’ සමාජ ශාලා වල පහසුකම් ලබාගත හැකිය.

ඊ. ගුවන් හමුදා රෝහල් වල වෛද්‍ය සහ දන්ත වෛද්‍ය පහසුකම් ලබා ගත හැකිය. මෙහිදී සාමාජිකයා සහ කලත්‍රයා පමණක් ආවරණය වේ.

(1) ගුවන් හමුදා රෝහල් වල බාහිර රෝගී ප්‍රතිකාර.
(2) හදවත් සහ අක්ෂි රෝගීන් සඳහා විශේෂඥ උපදේශන සේවා (රත්මලාන සහ කොළඹ පමණි).
(3) සීමා සහිත අභ්‍යන්තර රෝගී ප්‍රතිකාර(කොළඹ ගුවන් හමුදා රෝහලේ පමණි).
(4) කටුනායක ගුවන් හමුදා රෝහලේ නේවාසික රෝගී ප්‍රතිකාර (ආහාර සඳහා ගෙවීම් කල යුතුය, උපරිම සති දෙකක කාලයක් සඳහා පමණි).

උ. සාමාජිකයින්ගේ දරුවන් ආරක්ෂක සේවා විද්‍යාලයට ඇතුලත් කිරීමේ අවස්ථාව ලබාදීම.

**8. මියගිය විශ්‍රාමික සේවා පුද්ගලයන් වෙනුවෙන් සිදුකරනු ලබන සුභසාධන සේවාවන්**

අ. මරණාධාර දිමනාව

(1) සේවා පුද්ගලයාගේ මරණයෙන් පසු කලත්‍රයාට හෝ ළඟම ඥාතියා හට රු.40¸000.00ක මරණාධාර දීමනාවක් ලබා ගැනීම සඳහා හිමිකම් ඇත.

(2) මෙම මරණාධාර දීමනාව ලබා ගැනීම සඳහා මරණාධාර දීමනා අයදුම් පත්‍රය (Death Donation Application) සමඟ පහත සඳහන් ලියකියවිලි වල සහතික කරනලද පිටපත් ළඟම කඳවුරු සේවා ආයතන අරමුදල වෙත භාරදිය යුතුය.

(අ) මරණ සහතිකය.
(ආ) විවාහ සහතිකය.
(ඇ) කලත්‍රයාගේ හෝ ළඟම ඥාතියාගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්.

(ඉහත ලියවිලි තුල ඡායා පිටපත් තිබේනම් ඒවා නීතීඥයෙකු හෝ සාමදාන විනිශ්චයකාර වරයෙකු සහතික කර තිබිය යුතුය).

(3) සේවා පුද්ගලයා සේවයේ යෙදී සිටි අවසන් වසර පහක කාලය තුල මරණාධාර දිමනාව ලබා ගෙන ඇත්නම් එම සේවා පුද්ගලයා විසින් මධ්‍යම සුභසාධක හා පුනරුත්ථාපන අරමුදල (CW&RF) වෙත විශ්‍රාම යන දින පහත සඳහන් පරිදි මුදල් තැන්පත් කළයුතු වේ.

| **සේවයෙන් ඉවත්ව යාමට පෙර සම්පූර්ණ කර ඇති සේවා කාලය** | **මධ්‍යම සුභසාධක හා පුනරුත්ථාපන අරමුදල (CW&RF) වෙත ගෙවිය යුතු මුදල (රු.)** |
|---|---|
| වසර 12ක සේවා කාලයක් සම්පූර්ණ කල සියලුම සේවා පුද්ගලයින් සඳහා | 3,000.00 |
| වසර 22ක සේවා කාලයක් සම්පූර්ණ කර විශ්‍රාම ගන්නා ගුවන් හටයින් සහ වසර 15ක සේවා කාලයක් සම්පූර්ණ කර විශ්‍රාම ගන්නා නිලධාරිනියන් සහ ගුවන් කාන්තාවන් සඳහා | 4,000.00 |
| වසර 20ක සේවා කාලයක් සම්පූර්ණ කර විශ්‍රාම ගන්නා නිලධාරින් සඳහා | 5,000.00 |
| වසර 55ක සේවා කාලයක් සම්පූර්ණ කර විශ්‍රාම ගන්නා නිලධාරින් සහ නිලධාරිනියන් සඳහා | 5,000.00 |

ආ. පහත සඳහන් විශ්‍රාමික සේවා පුද්ගලයින් සඳහා සේවා අවමංගල්‍ය ගෞරව ලබාදෙනු ලැබේ (නිසි ඉල්ලීමක් සිදුකල යුතුය)

(1) අවුරුදු 20කට වැඩි හෝ ඊට සමාන සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්.

(2) අවුරුදු 22කට වැඩි හෝ ඊට සමාන සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ගුවන් භටයින්.

(3) අවුරුදු 15කට වැඩි හෝ ඊට සමාන සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරිනියන් සහ ගුවන් කාන්තාවන්.

(4) මෙම අවමංගල්‍ය ගෞරව හිමිවන්නේ නිසි විශ්‍රාම ගැන්වීමක් සිදු කරන ලද සේවා පුද්ගලයින් සඳහා පමණි.

## 9. විශ්‍රාමික සේවා හැඳුනුම්පත - මුලික නිකුත් කිරීම (F-1250 Q/P)

අ. විශ්‍රාමික සේවා හැඳුනුම්පතෙහි වලංගු කාල සීමාව වසර දහයකි.

ආ. ලබාදිය යුතු ලේඛන

(1) විශ්‍රාමික සේවා හැදුනුම්පත් ඉල්ලුම් කිරීමේ අයදුම්පත්‍රය.

(2) 2" x 2.5" වර්ණ ඡායාරූප 02
Officers and Airmen - Blazer with tie

Lady Officers and Airwomen - Suitable saree (Blazer Required)

ඇ. මෙම ලේඛණ වල මෘදු පිටපත් sop3@airfoce.lk වෙත එවීම හෝ දෘඩ පිටපත් P3 අංශය වෙත ලැබීමට සැලැස්විම සිදු කල හැකිය. (විශ්‍රාමික සේවා හැදුනුම්පත් ඉල්ලුම් කිරීමේ අයදුම්පතෙහි අත්සන අනිවාර්ය වේ).

ඇ.	සපුරාලිය යුතු සුදුසුකම්

| **නිලධාරීන්** | **ගුවන් භට** | **නිලධාරිණීන්/ගුවන් කාන්තාවන්** | **වෛද්‍ය හේතුන් මත සේවයෙන් විශ්‍රාම ගොස් ඇති සේවා පුද්ගලයින්** |
|---|---|---|---|
| වසර 20 ක් සම්පූර්ණ කිරීමෙන් පසු විශ්‍රාම වැටුපක් සහිතව විශ්‍රාම ගැනීම | වසර 22 ක් සම්පූර්ණ කිරීමෙන් පසු විශ්‍රාම වැටුපක් සහිතව විශ්‍රාම ගැනීම | වසර 15 ක් සම්පූර්ණ කිරීමෙන් පසු විශ්‍රාම වැටුපක් සහිතව විශ්‍රාම ගැනීම | වෛද්‍ය හේතූන් මත විශ්‍රාම වැටුපක් ලැබීම |

ඉ.	පහත දක්වා ඇති තමාට පහසු ආකාරයකින් මුද්‍රණය කරන ලද විශ්‍රාමික සේවා හැඳුනුම්පත ඔබට ලබා ගත හැකිය.

(1)	මූලස්ථාන ආරක්ෂක මැදිරියට පැමිණීම.

(2)	තමා පදිංචි නිවසට ළඟම කඳවුරේ ආරක්ෂක මැදිරියට පැමිණීම.

(3)	ලියාපදිංචි තැපැල මඟින් නිවසට ගෙන්වා ගැනීම.

(4)	සේවයේ නියුතු අනුප්‍රාප්තිකයෙකු මඟින් ගෙන්වා ගැනීම.

10. <u>**කල් ඉකුත්වී ඇති විශ්‍රාමික සේවා හැඳුනුම්පතක් නැවත සකස් කරගැනීම**</u>

පහත දක්වා ඇති ලියකියවිලි සමඟ නැවත විශ්‍රාමික සේවා හැඳුනුම්පතක් ලබාදෙන මෙන් අධ්‍යක්ෂ ජෙනරාල් පරිපාලන වෙත ලිපියක් යොමුකළ යුතුය.

අ. ජාතික හැඳුනුම්පතේ පිටපතක් (වෙනස්කම් සිදුවී ඇත්නම් එය සාමදාන විනිශ්චයකරුවෙක් හෝ ග්‍රාම නිලධාරී විසින් සහතික කර තිබිය යුතුය)

ආ. 2" x 2.5" වර්ණ ඡායාරූප 02

Officers and Airmen - Blazer with tie

Lady Officers and Airwomen - Suitable saree (Blazer Required)

ඇ. කල් ඉකුත්වූ විශ්‍රාමික සේවා හැඳුනුම්පත

**සැ.යුඃ මෙම ලේඛණ වල මෘදු පිටපත් sop3@airfoce.lk වෙත එවීම සිදු කරන අවස්ථාවලදී කල් ඉකුත්වූ විශ්‍රාමික සේවා හැඳුනුම්පත P3 අංශය වෙත ලැබීමට සැලැස්විය යුතුය.**

ඈ. පහත දක්වා ඇති තමාට පහසු ආකාරයකින් නැවත මුද්‍රණය කරන ලද විශ්‍රාමික සේවා හැඳුනුම්පත ඔබට ලබා ගත හැකිය.

(1) මූලස්ථාන ආරක්ෂක මැදිරියට පැමිණීම.

(2) තමා පදිංචි නිවසට ළඟම කඳවුරේ ආරක්ෂක මැදිරියට පැමිණීම.

(3) ලියාපදිංචි තැපෑල මඟින් නිවසට ගෙන්වා ගැනීම.

(4) සේවයේ නියුතු අනුප්‍රාප්තිකයෙකු මඟින් ගෙන්වා ගැනීම.

## 11. විශ්‍රාමික සේවා හැඳුනුම්පත අස්ථානගතවූ විට නැවත සකස් කරගැනීම

අ. විශ්‍රාමික සේවා හැඳුනුම්පත අස්ථානගතවූ විට පහත දක්වා ඇති ලේඛන සහිතව නැවත විශ්‍රාමික සේවා හැඳුනුම්පතක් ලබාදෙන මෙන් ඉල්ලා අධ්‍යක්ෂ ජෙනරාල් පරිපාලන වෙත ලිපියක් එවිය යුතුය.

(1) විශ්‍රාමික සේවා හැඳුනුම්පත නැති වූ බවට ලඟම පොලිසිය වෙත කරන ලද පැමිණිල්ලේ පිටපතක්.

(2) 2" x 2.5" වර්ණ ඡායාරූප 02

Officers and Airmen - Blazer with tie

Lady Officers and Airwomen- Suitable saree

(3) ගුවන් හමුදාවට ලබා දී ඇති ජාතික හැඳුනුම්පත් අංකය වෙනස් වී ඇත්නම් එය සඳහන් කළ යුතුය.

(4) මූලස්ථාන ගිණුම් අංශය වෙත රු.5000.00 ක මුදලක් ගෙවූ කුවිතාංසිය .

(5) වැඩිදුර තොරතුරු සඳහා 0112441044 දිගුව 12083 අමතා අදාල තොරතුරු ලබාගත හැකිය.

ආ. මෙම ලේඛණ වල මෘදු පිටපත් sop3@airfoce.lk වෙත එවීම හෝ දෘඩ පිටපත් P3 අංශය වෙත ලැබීමට සැලැස්විය හැකිය.

ඇ. පහත දක්වා ඇති තමාට පහසු ආකාරයකින් නැවත මුද්‍රණය කරන ලද විශ්‍රාමික සේවා හැඳුනුම්පත ඔබට ලබා ගත හැකිය.

(1) මූලස්ථාන ආරක්ෂක මැදිරියට පැමිණීම.

(2) තමා පදිංචි නිවසට ලඟම කඳවුරේ ආරක්ෂක මැදිරියට පැමිණීම.

(3) ලියාපදිංචි තැපැල මඟින් නිවසට ගෙන්වා ගැනීම.

(4) සේවයේ නියුතු අනුප්‍රාප්තිකයෙකු මඟින් ගෙන්වා ගැනීම.

## 12. <u>ගුවන් හමුදා සේවා වාර්ථාව (නිලධාරි) –Record of Service</u>

අ. වසර 12 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර සේවයෙන් ඉල්ලා අස්වන (Resignation of Commission), සේවයෙන් විශ්‍රාම ලබන (Retired) සහ වෛද්‍ය හේතුන් මත සේවයෙන් ඉවත්ව යනු ලබන (Invalidation over 10 years of service) නිලධාරින් සේවා වාර්ථාවක් ලබාගැනීමට සුදුසුකම් ලබයි.

ආ. තවද, පහත සඳහන් හේතුන් මත ගුවන් හමුදා සේවයෙන් ඉවත් යනු ලබන නිලධාරින් සහ කැඩෙට් නිලධාරින් සඳහා ඔවුන්ගේ ලිඛිත ඉල්ලීම මත සේවය සනාථ කිරිම/ සේවයෙන් ඉවත්වයාම සහතික කිරීමේ ලිපියක් නිකුත් කරනු ලැබේ.

(1) වසර 12 කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර නිත්‍යානුකූලව සේවයෙන් ඉල්ලා අස්වන (Resignation of Commission) නිලධාරින්.

(2) අධිකාරියෙන් ඉවත්කිරීම (Withdrawal of Commission), 'නින්දාසහගත ලෙස අධිකාරියෙන් නෙරපාහැරීම' (Cashiered) යන වගන්ති යටතේ සේවයෙන් පහ කරනු ලබන නිලධාරින්.

(3) මුදල් ගෙවා සේවයෙන් ඉවත්වීම, නියමු පොදු රාජකාරි කැඩෙට් නිලධාරින් අවම පුහුණු ශක්‍යතාවය මත සේවයෙන් ඉවත් කිරිම සහ 'සේවය තවදුරටත් අවශ්‍ය නොවේ' යන වගන්ති යටතේ සේවයෙන් පහ කරනු ලබන කැඩෙට් නිලධාරින්.

ඇ. සේවා වාර්ථාව සඳහා 3.5cm x 4.5cm (Passport Size) වර්ණ ඡායාරූප 02 පහත සඳහන් පරිදි ලබාදිය යුතුය.

(1) Air Cdre and above - 1B Ceremonial

(2) Any other officers - 1D Ceremonial

(3) 12 years completed officers - 2D Walking Out

ඈ. පහත දක්වා ඇති තමාට පහසු ආකාරයකින් මුද්‍රණය කරන ලද ගුවන් හමුදා සේවා වාර්ථාව ඔබට ලබා ගත හැකිය.

(1) මූලස්ථාන ආරක්ෂක මැදිරියට පැමිණීම.

(2) තමා පදිංචි නිවසට ලඟම කඳවුරේ ආරක්ෂක මැදිරියට පැමිණීම.

(3) ලියාපදිංචි තැපැල මඟින් නිවසට ගෙන්වා ගැනීම.

(4) සේවයේ නියුතු අනුප්‍රාප්තිකයෙකු මඟින් ගෙන්වා ගැනීම.

ඉ. ගුවන් හමුදා සේවා වාර්ථාව වලංගු වන්නේ එහි හිමිකරුගේ අත්සන යෙදීමෙන් පසු පමණි.

## 13. ගුවන් හමුදා සේවා සහතිකය (F.1394) සෙසු නිලයන් සඳහා Service Certificate

අ. වසර 12 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවා පුද්ගලයින්, විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන සහ වෛද්‍ය හේතූන් මත සේවයෙන් විශ්‍රාම ගොස් ඇති සේවා පුද්ගලයින් සේවා සහතිකයක් ලබාගැනීමට සුදුසුකම් ලබයි. මේ සඳහා පහත ලේඛණ කඳවුරු විධායක කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

(1) 2” x 2.5” වර්ණ ඡායාරූප 02
Airmen and Airwomen - Working Dress

(2) අදාල අංශභාර නිලධාරී මාර්ගයෙන් කඳවුරු විධායක කාර්යාලය වෙත යොමු කරන තොරතුරු පත්‍රිකාව

ආ. ‘සේවය තවදුරටත් අවශ්‍ය නොවේ’ යන වගන්තිය යටතේ සේවයෙන් පහ කරන සේවා පුද්ගලයින් සඳහා සේවා සහතිකය නිකුත් කරනු නොලැබේ.

ඇ. පහත දක්වා ඇති තමාට පහසු ආකාරයකින් මුද්‍රණය කරන ලද ගුවන් හමුදා සේවා සහතිකය ඔබට ලබා ගත හැකිය.

(1) මූලස්ථාන ආරක්ෂක මැදිරියට පැමිණීම.
(2) තමා පදිංචි නිවසට ළඟම කඳවුරේ ආරක්ෂක මැදිරියට පැමිණීම.
(3) ලියාපදිංචි තැපැල මඟින් නිවසට ගෙන්වා ගැනීම.
(4) සේවයේ නියුතු අනුප්‍රාප්තිකයෙකු මඟින් ගෙන්වා ගැනීම.

ඉ. ගුවන් හමුදා සේවා සහතිකය වලංගු වන්නේ එහි හිමිකරුගේ අත්සන යෙදීමෙන් පසු පමණි.

## 14. <u>ගුවන් හමුදා වෘත්තීය සහතිකය -Trade Certificate</u>

අ. සපුරාලිය යුතු සුදුසුකම්

අවුරුදු 5 සිට 12 දක්වා මුලික ගිවිස ගත් සේවා කාලය සම්පූර්ණ කරන ලද නීත්‍යානුකූලව සේවයෙන් ඉවත් වු සේවා පුද්ගලයින් (SNLR, Discharge With Ignominy සේවා පුද්ගලයින් හැර).

ආ. ලබාගත හැකි ආකාරය

ගුවන් හමුදා වෘත්තීය සහතිකය ලබා නොගත් ගුවන් හමුදාවෙන් ඉවත්වු සේවා පුද්ගලයින් අධ්‍යක්ෂක ජෙනරාල් පරිපාලන වෙත ලිඛිත ඉල්ලීමක් සිදුකළ යුතුය.

ඇ. පහත දක්වා ඇති තමාට පහසු ආකාරයකින් මුද්‍රණය කරන ලද ගුවන් හමුදා වෘත්තීය සහතිකය ඔබට ලබා ගත හැකිය.

(1) මූලස්ථාන ආරක්ෂක මැදිරියට පැමිණීම.

(2) තමා පදිංචි නිවසට ලඟම කඳවුරේ ආරක්ෂක මැදිරියට පැමිණීම.

(3) ලියාපදිංචි තැපැල මඟින් නිවසට ගෙන්වා ගැනීම.

(4) සේවයේ නියුතු අනුප්‍රාප්තිකයෙකු මඟින් ගෙන්වා ගැනීම.

## 15. <u>රණවිරු පවුල්වල දරුවන් සඳහා ලබාදෙන ශිෂ්‍යත්ව වැඩසටහන ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය</u>

අ. ලැබෙන වරප්‍රසාද

අදාල පාඨමාලා ගාස්තුවෙන් 50% ක මුදලක් අඩු කෙරේ (තෝරාගත් සිසුන් සඳහා පමණි).

ආ. සපුරාලිය යුතු සුදුසුකම්

අදාල සේවා පුද්ගලයා (මව හෝ පියා) විශ්‍රාම වැටුපක් ලැබීමට සුදුසුකම් සපුරාලිය යුතුය.

ඇ. පහත දක්වා ඇති ලේඛන සමඟ ලිඛිත ඉල්ලීමක් අධ්‍යක්ෂ ජෙනරාල් පරිපාලන වෙත සිදුකල යුතුය.

(1) දරුවාගේ උප්පැන්න සහතිකයේ පිටපතක්.

(2) දරුවාගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්.

(3) ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය මඟින් ඉල්ලුම් කර ඇති ලිපියේ පිටපතක්.

ඈ. අධ්‍යක්ෂ ජෙනරාල් පරිපාලන වෙත යොමු කළ යුතු ලිපිය තුල පහත තොරතුරු ඇතුළත් විය යුතුය. මෙම ලිපියේ මෘදු පිටපත් අධ්‍යක්ෂ ජෙනරාල් පරිපාලන වෙත dga@airforce.lk හරහා යොමු කිරීම ප්‍රමාණවත් වේ.

(1) මව/පියාගේ සේවා අංකය, නිලය, නම හා වෘත්තීය, ගුවන් හමුදාවට බැඳුනු දිනය හා සේවයෙන් ඉවත් වු දිනය.

(2) දරුවාගේ සම්පූර්ණ නම, අයදුම්කරන උපාධි පාඨමාලාව සහ කැදවීම් අංකය.

## 16. <u>රණවිරු පවුල්වල දරුවන් සඳහා රජයේ විශ්ව විද්‍යාල වල ඇතුලත්වීම් ලබාදීම</u>

අ. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් රජයේ විශ්ව විද්‍යාල සඳහා සිසුන් බඳවා ගැනීමේදී නියමිත බඳවාගැනීම් වලට අමතරව පහත සඳහන් පාඨමාලාවන් සඳහා යෝජිත බඳවාගැනීම් වලින් 0.5% ක් සඳහා රණවිරු පවුල්වල දරුවන් ඇතුලත් කිරීමට අවස්ථාව සලසාදී ඇත.

(1) වෛද්‍ය පාඨමාලාව
(2) දන්ත ශල්‍ය වෛද්‍ය පාඨමාලාව
(3) ඉංජිනේරු පාඨමාලාව

ආ. මෙහිදී පාඨමාලාවන් සඳහා ඉල්ලුම් කරන, විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් වියයුතුය.

ඇ. සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගන්නා සිසුන් වෛද්‍ය පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය.

ඈ. එම වෛද්‍ය පරීක්ෂණයෙන් සමත්වන සිසුන් නියමිත කාල පරිච්ඡේදයක් සඳහා ගුවන් හමුදාවේ සේවය කිරීමේ බැඳුම්කරයකට යටත්ව ගුවන් හමුදාවට ඇතුලත් කරගනු ලැබේ.

ඉ. මෙම පාඨමාලාවන් සඳහා අයදුම්පත් කැඳවීම පිළිබඳ වැඩිදුර තොරතුරු මූලස්ථාන සංවිධාන අංශය මඟින් සියලු ගුවන් හමුදා කඳවුරු සහ ශ්‍රී ලංකා ගුවන් හමුදා සේවා මුක්ත සංගමය දැනුවත් කරනු ලබයි.

## 17. විශ්‍රාමික ගුවන් හමුදා නිලධාරීන්ගේ සංගමය (Retired Air Force Officers Association)

අ. www.airforce.lk/rafoa/ දරන වෙබ් අඩවිය වෙත පිවිසීම තුලින් සාමාජිකත්වය ලබා ගත හැකිය.

ආ. සාමාජිකත්වය ලබා ගැනීම පිලිබඳ සහ ඔබ වෙත ලැබෙන ප්‍රතිලාභ පිලිබඳ තොරතුරු පහත දුරකථන අංක ඇමතීම මඟින් ලබා ගත හැකිය.

071 8580079 Gp Capt Kumara Kirinda (Retd)
President RAFOA

077 3431316 Air Cdre Ayub Jabir (Retd)
Secretary RAFOA

ඇ. එක්වරක් පමනක් ගෙවිය යුතු සාමාජික මුදල රු.2,500.00කි.

## 18. ශ්‍රී ලංකා ගුවන් හමුදා සේවා මුක්ත සංගමය (Sri Lanka Ex Servicemen Association)

අ. ශ්‍රී ලංකා ගුවන් හමුදා සේවා මුක්ත භට සංගමයේ අයදුම්පත්‍රය නිසි පරිදි පුරවා සංගමයේ කාර්යාලය වෙත භාර දිය යුතුය. ඒ සඳහා අයදුම් පත්‍රය ශ්‍රී ලංකා ගුවන් හමුදා සේවා මුක්ත භට සංගමය මඟින් ලබා ගත යුතුය.

ආ. එක්වරක් පමණක් ගෙවිය යුතු සාමාජික මුදල රු.3,000.00කි.

ඇ. සාමාජිකයින් සඳහා සංගමය මඟින් ලබා දෙනු ලබන නිවාඩු නිකේතනවල පහසුකම් ලබා ගත හැකිය. වෙන් කරවා ගැනීම් සඳහා 0113355886 ඔස්සේ ශ්‍රී ලංකා ගුවන් හමුදා සේවා මුක්ත භට සංගම් කාර්යාලය අමතන්න.

ඇ. වැඩිදුර විස්තර ලබා ගැනීම සඳහා පහත දුරකථන අංක ඇමතීම මඟින් හෝ www.airforce.lk/afesa/ දරන වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ලබාගත හැක.

0112340045
0740410278
0740170604
0740402421
0112441044 දිගුව 23285

## 19. <u>ශ්‍රී ලංකා ගුවන් හමුදා සේවා මුක්ත සංගමයේ සුව සුරැකුම් සුභසාධක අරමුදල</u>

අ. සාමාජිකත්වය ලබාගැනීම සඳහා එක් සේවා පුද්ගලයෙකුගෙන් රු.5,280.00ක මුදලක් සංගමය වෙත ලැබී තිබිය යුතුය (විශ්‍රාම යන දින දක්වා වැටුපෙන් අවකරනය වී තවදුරටත් හිඟ මුදලක් ඇත්නම් එම මුදල ගෙවිය යුතුය)

ආ. ප්‍රතිලාභ

(1) සාමාජිකයෙකුගේ මරණයකදී කලත්‍රයාට හෝ ළඟම ඥාතියා හට රු 70,000.00ක මරණාධාර දීමනාවක් ලබා ගැනීම සඳහා හිමිකම් ඇත.

(2) කලත්‍රයාගේ මරණයකදී සාමාජිකයාට රු 35,000.00ක මරණාධාර දීමනාවක් ලබා ගැනීම සඳහා හිමිකම් ඇත.

**සැ.යුඃ ශ්‍රී ලංකා ගුවන් හමුදා සේවා මුක්ත සංගමයේ සාමාජිකයෙකු සුව සුරැකුම් සුභසාධක අරමුදලේ සාමාජිකත්වය ලබාගෙන නොමැතිනම්, සාමාජිකයාගේ මරණයකදී පමනක් කලත්‍රයාට හෝ ළඟම ඥාතියා හට මරණාධාර දීමනාව ලෙස රු 10,000.00ක මුදලක් හිමිවේ.**

(3) සාමාජිකයෙකුගේ දරුවන් රාජ්‍ය විශ්ව විද්‍යාලයක අධ්‍යාපනය ලබන්නේනම් ඔවුන් සඳහා මසකට රු. 700.00ක ශිෂ්‍යත්ව දීමනාවක් ගෙවනු ලබයි.

(4) සුව සුරැකුම් සුභසාධක අරමුදලේ වෛද්‍ය ප්‍රදාන

| ගෙවීම් සිදුකරන කාරණාව | ගෙවන උපරිම මුදල (රු.) |
|---|---|
| හදවත් සැත්කම් | 50,000.00 |
| ප්‍රධාන සැත්කම් | 40,000.00 |
| සුළු සැත්කම් | 30,000.00 |
| විශේෂ පරීක්ෂණ සඳහා | 20,000.00 |
| ඇසේ සුද ඉවත්කිරීම | 6,000.00 |

## 20. ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමය

අ. ප්‍රතිලාභ

(1) වෛද්‍යාධාර පහසුකම්

| ගෙවීම් සිදුකරන කාරණාව | ගෙවන මුදල (රු.) |
|---|---|
| බයිපාස් සැත්කම් | 100,000.00 |
| ප්‍රධාන සැත්කම් | 100,000.00 |
| සුළු සැත්කම් | 40,000.00 |
| විශේෂ පරීක්ෂණ සඳහා | 25,000.00 |
| ඇසේ සුද ඉවත්කිරීම | 8,000.00 |

(2) සාමාජිකයාගේ කලත්‍රයා හෝ වයස අවු 18ට අඩු දරුවන්ගේ දරුණු රෝගාබාධ සඳහා 'සාමාජික පවුල් සුභසාධක පහසුකම් ව්‍යාපෘතිය' යටතේ මූල්‍ය ආධාර ලබාදීම.

(3) ඇස් කණ්නාඩි ලබා ගැනීම සඳහා වසර දෙකකට වරක් රු. 5,000.00ක් ලබාදීම.

(4) වෛද්‍ය උපදෙස් මත ශ්‍රවණාධාර සඳහා අවශ්‍ය විටදී රු. 10,000.00ක් ලබාදීම.

(5) වයස අවු 90 ඉක්මවූ සාමාජිකයින් සඳහා රු. 10,000.00ක දීමනාවක් එක් වරක් පමණක් ලබාදීම.

(6) රාජ්‍ය විශ්ව විද්‍යාලයක හෝ කාර්මික විද්‍යාලයක අධ්‍යාපනය ලබන සාමාජිකයින්ගේ දරුවන් සඳහා මසකට රු.1,500.00ක ශිෂ්‍යත්ව දීමනාවක් ලබාදීම.

(7) සාමාජිකයන් සඳහා බෝලගල, කටුගස්තොට සහ අකුරැස්ස පිහිටි රණවිරු ප්‍රවීණයන්ගේ නිවාසවල නේවාසික පහසුකම් ලබාදීම.

(8) ස්වාභාවික විපත් වෙනුවෙන් සාමාජිකයින් සඳහා මූල්‍ය ආධාර ලබාදීම.

(9) සහනදායි පොලී ප්‍රතිශතයන් මත රු.500,000.00 දක්වා ණය පහසුකම් ලබාදීම.

(10) පිළිගත් භාණ්ඩ හා සේවා සපයන්නන් වෙතින් සිදු කරන මිලදීගැනීම් සඳහා සේවා මුක්ත භට සංගම් හැඳුනුම්පත ඉදිරිපත් කිරීමෙන් විශේෂ වට්ටම් ලබාගත හැකිය.

(11) ත්‍රිවිධ හමුදා සේවයේදී ලබා ඇති වෘත්තිය සුදුසුකම් අනුව කිසිදු බාධාවකින් තොරව සේවා මුක්ත භට සංගමය හරහා වෘත්තීය පුහුණු අධිකාරිය මඟින් ජාතික වෘත්තීය සුදුසුකම් සහතික (NVQ) ලබාගත හැකිය.

(12) නොමිලේ පුස්තකාල පහසුකම්.

**වැදගත්**

1. විශ්‍රාම යාමේදී හිමිවන පාරිතෝෂික මුදල ලබා ගන්නේ නම් වසර 10ක් වනතුරු විශ්‍රාම වැටුප් ප්‍රතිශතයෙන් 10% ක ප්‍රතිශතයක් එම ලබාගන්නා පාරිතෝෂිකය ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා අයකරනු ලබයි. එබැවින් වසර 10 සම්පූර්ණ වූ පසු නිවැරදි ප්‍රතිශතය හිමිවන්නේද යන්න පරික්ෂා කරගත යුතුවේ.

2. විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය සුරක්ෂිතව ළග තබා ගන්න.

3. W&OP හිමිකම් පත්‍රය සුරක්ෂිතව ළග තබා ගන්න.

4. විශ්‍රාමික හැඳුනුම්පත සුරක්ෂිතව ළග තබා ගන්න.

5. ඔබගේ ජීවත්වීම තහවුරු කිරිමේ සහතිකය තම ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත සෑම වසරකම මාර්තු මස 31 දිනට පෙර ලබා දීමට කටයුතු කරන්න.

6. සේවා පුද්ගලයා මියගිය පසු කලත්‍රයා විසින් ළඟම ඇති ගුවන් හමුදා කඳවුර දැනුවත් කළයුතු වේ.

7. මෙම සියලු විස්තර පිළිබඳ ඔබගේ කලත්‍රයා දැනුවත් කළ යුතු වේ.

8. ඔබ විශ්‍රාම ගැනීමට පෙර ඔබගේ මුලික වැටුපෙහි නිවැරදිතාවය තහවුරු කරගත යුතු අතර, ඔබට අදාල සියලුම පුද්ගල සිදුවිම්, විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගැනීමට ප්‍රථම පුද්ගල සිදුවිම් වාර්තා කරගත යුතු වේ.

9. ඔබට උසස් සේවයක් සැපයිම සඳහා ගුවන් හමුදා මූලස්ථානය කැපව සිටී.

10. අවශ්‍ය අයදුම්පත් පහත QR කේතය ඔස්සේ ලබාගත හැක